Ministry for Ethnic Communities
Te Tari Mātāwaka

# විදෙස් මැදිහත්වීමක් වාර්තාකරන්නේ කෙසේද

නවසීලන්තයේ ජනවාර්ගික ප්‍රජාවන්ට විදේශීය මැදිහත්වීම් ඉවසා සිටීමට අවශ්‍ය නැත. පහත ක්‍රම ඔස්සේ ඔබට විදෙස් මැදිහත්වීම් වාර්තා කළ හැක.

### හදිසි අවස්ථාවකදී

එය දැන් සිදුවෙමින් පවතී නම්, 111 අමතා පොලීසිය ඉල්ලා සිටින්න

ඔබට කතා කළ නොහැකි නම් සහ ඔබ ජංගම දුරකථන ඇමතුමක සිටී නම්, නිශ්ශබ්දව 'press 55 (55 ඔබන්න)' විමසුමට සවන් දෙන්න.

ඔබට කතා කිරීමට නොහැකි නම් සහ ඔබ ස්ථාවර දුරකථනයක් ඔස්සේ ඇමතුමක සිටී නම්, නිශ්ශබ්දව සිටින්න, උදව් සඳහා ඕනෑම බොත්තමක් ඔබන්නැයි ක්‍රියාකරු ඔබට පවසන දේට සවන් දෙන්න.

## විදෙස් මැදිහත්වීමක් වාර්තාකිරීම

නවසීලන්තය විදේශ මැදිහත්වීම් වලින් ආරක්ෂාකර ගැනීමට NZSIS හෝ පොලිසියට වාර්තා කිරීමෙන් අප සැමට උදව් කළ හැකිය. ඔබ කුමන ක්‍රමයක් තෝරාගත්තත්, ඔවුන් ඔබේ තොරතුරු නිවැරදි ස්ථානයට ලැබෙන බවට වග බලාගනී.

## විදෙස් මැදිහත්වීම් NZSIS වෙත වාර්තාකරන්න

NZSIS වෙබ් අඩවියේ ආරක්ෂිත මාර්ගගත පෝරමය භාවිතයෙන් ඔබට විදේශීය මැදිහත්වීම් වාර්තාකළ හැකිය.

ඔබට අවශ්‍ය නොවේනම් ඔබේ නම, දුරකථන අංකය හෝ සම්බන්ධතා තොරතුරු වැනි ඔබේ පුද්ගලික තොරතුරු ලබාදීමට අවශ්‍ය නැත. ඔබට ඔබේම භාෂාවෙන් පෝරමය පිරවිය හැකිය.

ඔබට NZSIS හි කෙනෙකු සමඟ කතාකිරීමට අවශ්‍ය නම්, ඔබට **+64 4 472 6170** හෝ **0800 747 224** අංකයෙන් ඔවුන් ඇමතිය හැක.

NZSIS ඔබේ වාර්තාව දුටු විට, ඔවුන් එය පරීක්ෂාකරනු ඇත. ඔබ ඔබේ සම්බන්ධතා තොරතුරු තැබුවහොත්, NZSIS ඔවුන්ට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම් පමණක් ඔබව සම්බන්ධ කර ගනු ඇත. NZSIS ඔබව සම්බන්ධ කර නොගන්නේ නම්, ඔවුන් ඔබේ වාර්තාව නොසලකාහැර ඇති බවක් අදහස් නොවේ.

## විදෙස් මැදිහත්වීම් පොලිසියට වාර්තාකරන්න.

හදිසි අවස්ථාවක් නොවේ නම්, ඔබට මෙම ක්‍රමවලින් පොලිසිය ඇමතිය හැක:

- 105 මාර්ගගත පෝරමය භාවිතයෙන්
- ඕනෑම ජංගම දුරකථනයකින් හෝ ස්ථාවර දුරකථනයකින් 105 අංකයට ඇමතීමෙන්, මෙම සේවාව නොමිලේ වන අතර රට පුරා 24/7 ලබාගත හැකිය.

පොලිසියට ඔබේ වාර්තාව සැකසීමට සහ ඔබ සමඟ පසු විපරම් කිරීමට උපකාර කිරීම සඳහා 105 පෝරමය ඔබේ පුද්ගලික තොරතුරු කිහිපයක් ඉල්ලාසිටී. පොලිසිය මෙම තොරතුරු භාවිතාකරන්නේ අවසර ලත් අරමුණු සඳහා පමණි.